## කුරුවිට ප්‍රාදේශීය සභාව

## රත්නපුර දිස්ත්‍රික්කය

01. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 26 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 27 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජුලි 14 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 අහිතකර මතය
-----------------

මෙම වාර්තාවේ 1.3.1 හා 1.3.2 ඡේදවල දක්වා ඇති කරුණුවල වැදගත්බව හේතුවෙන් 2015 දෙසැම්බර් 31 දිනට කුරුවිට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ඝන අපද්‍රව්‍ය ව්‍යාපෘතිය සඳහා පුස්සැල්ල වත්තේ රු. 3,500,000 ක මුදලකට මිලදී ගෙන තිබූ ඉඩමේ වටිනාකම, 209 ප්‍රාග්ධන වැය ශීර්ෂයට හර කර මුදල් බැර කිරීමෙන් ඔබ්බට වත්කම් වැඩිවීම හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීම පිළිබඳ ගිණුමට ගලපා නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ වරිපනම් බදු හා අක්කර බදු සඳහා පිළිවෙලින් රු. 42,987 ක් හා රු.390ක් වශයෙන් රු. 43,377 ක දුන් වට්ටම් වර්ෂයේ වියදමට ගලපා ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) මූල්‍ය ප්‍රකාශන අනුව දේශීය ණය හා සංවර්ධන අරමුදලට හා ආසියානු සංවර්ධන බැංකුවට වන බාහිර වගකීම පිළිවෙලින් රු. 36,201 ක් හා රු. 63,528 ක් ලෙස එකතුව රු. 99,729 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) වැය විෂයය 108 හා 203 ට අදාලව වැය ලේඛණය හා ගිණුම අතර රු. 20,000 ක් හා රු.405,979 ක් වශයෙන් රු. 425,979 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී හා පසුගිය වර්ෂවලදී පරිත්‍යාග වශයෙන් ලද මෝටර් රථ, යන්ත්‍ර සූත්‍ර හා යන්ත්‍රෝපකරණ, පුස්තකාල පොත් සහ ලී බඩු හා සවිකිරීම් ප්‍රාග්ධන යෙදුමට ආධාර මඟින් දායක වීමේ ගිණුමට සටහන් නොකර ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුම මඟින් සටහන් කර තිබුණි.

(ඊ) සභා බල ප්‍රදේශයේ සංවර්ධන කටයුතු වෙනුවෙන් පළාත් සභාව මඟින් සහ මධ්‍යම රජය මඟින් ලැබූ ප්‍රාග්ධන ආධාර රු.94,780,915ක් ප්‍රාග්ධන ආධාර වශයෙන් ගිණුම් ගත කර තිබූ නමුත්, එම වියදම්

ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියාව හා නඩත්තු වැය ශීර්ෂය යටතේ අයහාර වියදම් වශයෙන් ගිණුම්ගත කිරීමෙන් මූල්‍ය හා මෙහෙයුම් ප්‍රකාශයේ විශාල මෙහෙයුම් ඌණතාවයක් පෙන්නුම් කර තිබුණි.

(උ) සභා බල ප්‍රදේශයේ ක්‍රියාත්මක කරන ලද අන්තර් ගම්මාන ව්‍යාපෘතියට අදාල රු. 2,471,752 ක් හා එම ව්‍යාපෘතියට අදාලව ඉකුත් වර්ෂ කිහිපයකදී ස්ථාවර තැන්පතු ලෙස ආයෝජනය කරන ලද මුදල් වලට අදාලව ලද රු. 1,726,001 ක් සමඟ එකතුව රු.4,197,753ක මුදලක් සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ආදායම් වශයෙන් ගිණුම්ගත කර තිබුණි.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

-----------------------------

ගිණුම් විෂයයන් 03 කට අදාලව සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව දැක්වෙන ශේෂයන් සහ උපයෝගී ලේඛණ අනුව දැක්වෙන ශේෂයන් අතර රු. 22,299,125ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.3 නීති රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

-----------------------------------------------------

පහත දැක්වෙන නීති රීති, රෙගුලාසි වලට හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව. | අනුකූල නොවීම්. |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (I) | මුදල් රෙගුලාසි අංක 371 | 2010 පෙබරවාරි මසදී එවකට සභාවේ සභාපතිවරයාට තායිලන්ත අධ්‍යයන චාරිකාව සඳහා ලබා දී ඇති රු. 100,000 ක්වූ අත්තිකාරම් මුදල සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් පියවීමට කටයුතු කර නොතිබුණි. |
| (II) | මුදල් රෙගුලාසි අංක 371(2) | තත්කාර්යය අතුරු අග්‍රිමයක් ලබා දීමේදී එක් අවස්ථාවකදී රු. 20,000 ට නොවැඩි විය යුතු වුවත්, ප්‍රාදේශීය සභාව විසින් උක්ත රෙගුලාසියට පටහැනිව අත්තිකාරම් මුදල් ලෙස රු. 379,789 ක් අවස්ථා 02 කදී ලබා දී තිබුණි. |
| (III) | මුදල් රෙගුලාසි අංක 371(2) (ඇ) | යථෝක්ත රෙගුලාසිය ප්‍රකාරව දෙන ලද අත්තිකාරමේ කාර්යය නිම කල විගසම පියවිය යුතු වුවත්, 2009, 2010 හා 2014 වර්ෂ සඳහා දෙන ලද අත්තිකාරම් රු. 1,144,135 ක් පියවා නොතිබුණි. |
| (IV) | මුදල් රෙගුලාසි අංක 570 හා 571 | යථෝක්ත රෙගුලාසිය ප්‍රකාරව රු. 1,315,319 ක්වූ තැන්පතු නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි. |

02. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායමට වඩා වැඩිවූ පුනරාවර්තන වියදම රු. 88,158,178 ක්වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායමට වඩා වැඩිවූ පුනරාවර්තන වියදම රු. 17,172,231 ක් විය.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය මෙහෙයුම් ඌණතාවය රු.70,985,947 කින් වැඩිවී තිබූ අතර, එය පසුගිය වර්ෂයට වඩා සියයට 413 ක වැඩිවීමක් බව නිරීක්ෂණය විය. මෙයට ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ, වැටුප් හා දීමනා වල සියයට 26 ක වැඩිවීමත්, ප්‍රාග්ධන අළුත්වැඩියා වියදම්හි සියයට 390 ක වැඩිවීමත් වේ.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. '000' | රු. '000' | රු. '000' |
| වරිපනම් හා බදු | 2,006 | 2,769 | 4,423 |
| බදු කුලී | 5,549 | 5,772 | 5,677 |
| බලපත්‍ර ගාස්තු | 1,086 | 1,659 | - |
| වෙනත් ආදායම් | 49,545 | 50,343 | 17,129 |

2.3.2. ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම, රැස්කල ආදායම සමඟ සැසඳීමේදී සේවා සඳහා ගාස්තු යන ආදායම් විෂයයේ රැස්කල ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා සියයට 24ක අඩුවීමක් පෙන්නුම් කෙරිණි.

2.3.3 වරිපනම් බදු

2015 ජූනි 30 දින වනවිට රු. 17,184,751 ක හිඟ වරිපනම් බදු ශේෂයක්ද, රු. 2,114,488 ක හිඟ අක්කර බදු ශේෂයක්ද පැවති අතර, එකී හිඟ බදු ශේෂ විගණිත දිනය වූ 2015 ඔක්තෝබර් 12 දින වනවිටත් අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. වරිපනම් බදු වලින් සියයට 33 ක් වර්ෂ 04 කට වැඩි හිඟ ශේෂයක් වන අතර, අක්කර බදු වලින් සියයට 35ක් වර්ෂ 03 කට වැඩි හිඟ ශේෂයක් බව නිරීක්ෂණය විය.

2.3.4 බදුකුලී

-------

ප්‍රදේශය තුල පවතින කර්මාන්ත හා ව්‍යාපාර පිළිබඳ සමීක්ෂණයක් සිදුකර ලේඛණයක් නඩත්තු කර නොතිබුණි. මේ නිසා බල ප්‍රදේශයේ පවතින සියළු ව්‍යාපාර හා කර්මාන්ත වලින් නියමිත බදු මුදල් අය කර තිබුණේද යන්න පිළිබඳව පරීක්ෂා කිරීමට නොහැකි වූ අතර, සභාවට ලැබුණු ආදායම් පමණක් ලේඛණගත කර තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

2.3.5 වෙනත් ආදායම්

-------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ 05 ක කාලයක් ඉක්මවා ඇති පොදු වෙළඳපල අංක 17, 23, 24, 27 හා 28 යන කඩකාමර සඳහා රු. 4,436,000 ක මුදලක් හිඟ කඩකාමර කුලී හා හිඟ අධි ගාස්තු වශයෙන් අයවීමට ඇති අතර, එකී කඩකාමර 2014 ජූලි 30 දින මුද්‍රා තබා ප්‍රාදේශීය සභාවට පවරා ගෙන තිබුණි. නමුත් එකී කඩකාමරයන්හි හිඟහිටි මුදල් හා කඩහිමියන් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) 2014 වර්ෂය වෙනුවෙන් අය නොවූ රු. 116,850 ක ප්‍රවාරණ දැන්වීම් ගාස්තු අය කර ගැනීමට විගණිත දිනය වූ 2015 ඔක්තෝබර් 12 දින වනවිටත් කටයුතු කර නොතිබුණි.

(ඇ) සභා බල ප්‍රදේශය තුල පවතින දැන්වීම් වර්ග හඳුනාගෙන ගැසට් නිවේදනය අනුව ගාස්තු අයකර සභා ආදායම වැඩි කර ගැනීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් අනුගමනය කර නොතිබුණි. විගණිත දිනය වූ 2015 ඔක්තෝබර් 12 දින වනවිටත් ආයතන 07 කින් රු. 87,789 ක ආදායමක් ලැබී තිබූ අතර,පෞද්ගලික දැන්වීම් ප්‍රවරණ ආයතනයක් මඟින් අයවිය යුතු රු. 113,832 ක මුදලින් රු. 63,054 ක් අයවී තිබුණි. තවද, ආයතන 04කින් ලැබිය යුතු රු. 71,604 ක ප්‍රවාරණ දැන්වීම් ගාස්තු අයකර ගැනීම සම්බන්ධයෙන් සභාව කටයුතු කර නොතිබුණි.

2.3.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු

------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 දෙසැම්බර් සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ලැබිය යුතු උසාවි දඩ මුදල් හඳුනාගෙන ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) රත්නපුර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා ලැබිය යුතු මුද්දර ගාස්තු හඳුනාගෙන එම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද, හොරණ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් 2014 ඔක්තෝබර් සිට 2015 ජනවාරි දක්වා ලැබිය යුතු රු. 510,600 ක මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබු අතර, අවිස්සාවේල්ල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් සමාලෝචිත වර්ෂයේ ජූලි සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් දක්වා ලැබිය යුතු මුද්දර ගාස්තු හඳුනාගෙන අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

03. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

2012 ඔක්තෝබර් 15 දින කුරුවිට නගර සංවර්ධනය හේතුවෙන් ඉවත් කල පොදු වෙළඳපලේ කඩකාමර 02 ක් සම්බන්ධයෙන් වූ රු. 2,602,897 ක හිඟ කඩකාමර කුලී හා 2013 මැයි 10 දින මුද්‍රා තබන ලද පොදු වෙළඳපලේ කඩකාමර 04 ක් සම්බන්ධයෙන් වූ රු. 2,112,597 ක හිඟ කඩකාමර කුලී සම්බන්ධයෙන් අධිකරණයේ නඩු පවරා තිබූ අතර, 2015 ඔක්තෝබර් මාසය වනවිට එකී නඩු සම්බන්ධයෙන් රු. 78,915 ක වියදමක් දරා තිබුණි.

3.2 අවිධිමත් ගනුදෙනු

-----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2009, 2010, 2014 හා 2015 වර්ෂයන් සඳහා සභාවේ කාර්යය මණ්ඩලය, සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය සහභාගී වූ අධ්‍යාපන හා විනෝද චාරිකා සඳහා අවස්ථා 04 කදී රු.539,789ක වියදමක් දරා තිබුණි. එම චාරිකාවන් සම්බන්ධයෙන් ලබාගත් අනුමැතියක් හෝ ප්‍රාදේශීය සභා මුදල් යොදවා සිදු කරන ලද මෙවැනි කටයුතු සඳහා ප්‍රතිපාදන වෙන් කර ගැනීම මෙන්ම අදාල චාරිකාවෙන් ආයතනයක් වශයෙන් ලබාගත් ප්‍රයෝජනය පිළිබඳ කිසිදු තොරතුරක් විගණනයට ඉදිරිපත් නොවුණි. තවද, උක්ත විනෝද හා අධ්‍යයන චාරිකාවට අදාලව ලබාගත් අත්තිකාරම් රු. 539,789 ක් පියවීමටද 2016 මැයි මාසය දක්වා කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මැයි මස 15 දින සභාවේ නිල කාලය අවසන් වී තිබූ අතර, සභික දීමනා වශයෙන් සභිකයින් දෙදෙනෙකු සඳහා රු. 15,000 ක් වැඩිපුර ගෙවා තිබුණි.

3.3 කොන්ත්‍රාත් පරිපාලනය

----------------------------

2015 මැයි 11 දින කුරුවිට වෙළඳ සංකීර්ණයේ (Type 01) ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් රු. 2,357,232 ක අත්තිකාරම් මුදලක් ලබා දී තිබුණි.අධිකරණ නියෝගයක් හේතුවෙන් කොන්ත්‍රාත්කරු ඉදිකිරීම් අතර මැද නවතා දමා තිබුණි.

04. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

----------------------------------------

4.1 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

--------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

4.2 අභ්‍යන්තර විගණනය

------------------------

අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා ඒ සඳහා අවශ්‍ය පහසුකම් සපයා ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

4.3 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම

විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගෙන නොතිබුණි.

## 05. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) කොන්ත්‍රාත් පරිපාලනය